# ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී.

## වැදගත් කරුණු ලේඛනය

## වාණිජ බැංකු සේවා

# වැදගත් කරුණු ලේඛනය -

| නිපැයුම / සේවාව | නිපැයුම් විස්තරය | මූල්‍ය සහ වෙනත් ප්‍රතිලාභ | අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය | ප්‍රධාන කොන්දේසි සහ නියම |
|---|---|---|---|---|
| **බැංකු අයිරා** | ක්‍රියාකාරී ප්‍රාග්ධන කළමනාකරණය සහ පාලන අරමුණු වෙනුවෙන් බැංකු අයිරා පහසුකම්. | අපනයන හා ආනයන ගනුදෙනුකරුවන්ගේ නිෂ්පාදන සහ වෙළෙඳ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ක්‍රියාකාරී ප්‍රාග්ධනය/ පාලන වියදම්/ මුදල් ප්‍රවාහ කළමනාකරණය සඳහා ශක්තිය ලබා දීම. | 1. ක්‍රියාකාරී ප්‍රාග්ධන පහසුකමට අදාලව 4796267 යන දුරකථන අංකයෙන් ආයතනික බැංකුකරණ දෙපාර්තමේන්තුවේ (CBD) ප්‍රධානී හෝ 2448448 යන දුරකථන අංකයෙන් ආයතනික බැංකුකරණ දෙපාර්තමේන්තුවේ කණ්ඩායම් නායක (TL) / සබඳතා කළමනාකරු (RM) අමතන්න. | වාණිජ බැංකුකරණ පහසුකම්වල ප්‍රමිතිගත ප්‍රතිමානයන් පහත දක්වේ. කෙසේ වෙතත් මේවා ව්‍යාපාරයෙහි ස්වභාවය, ක්‍රියාකාරී ප්‍රාග්ධන චක්‍රය සහ අවදානම් පැතිකඩ යන කරුණු මත රඳා පවතී. |
| **ණයවර ලිපි** | අමුද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ සහ ඒ ආශ්‍රිත භාණ්ඩ අපනයනය සඳහා ණයවර ලිපි විවෘත කිරීම. | | | 1. **පිරිවැටුම් පර්යන්තය:** වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 600 හෝ ඊට වැඩි ගනුදෙනුකරුවන්. |
| **ආනයන ණය** | ආනයනයන් සඳහා ණය. | | | |
| **කෙටි කාලීන ණය** | බිල් පත් ආනයනය, බදු ගෙවීම් සහ වෙනත් ක්‍රියාකාරී ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා මූල්‍ය සම්පාදනය. | | 2. තනතුර දරණ TL/ RM ගනුදෙනුකරුගේ කාර්යාලයට හෝ කර්මාන්තශාලාවට පැමිණ ලබා ගන්නා මුදල් ප්‍රමාණය සහ අදාල තොරතුරු නිවැරදිදැයි පරීක්ෂා කරයි. | 2. **පොලී අනුපාතිකය:** පවතින වෙළෙඳපොල අනුපාත සහ ගිවිසුම්ගත නැවත ගෙවීමේ කාලය අනුව අවදානම් ප්‍රතිලාභය මත පදනම් වේ. |
| **ඇසුරුම් මූල්‍ය ණය** | භාණ්ඩ අපනයනයට අදාලව අමුද්‍රව්‍ය මිලදී ගැනීමට සහ ආශ්‍රිත පිරි සැකසුම් වියදම් සඳහා අපනයනකරුවන්ට පූර්ව අපනයන මූල්‍ය පහසුකම් ලබා දීම. | | | 3. **අයකිරීම්:** බැංකුවේ ප්‍රමිතිගත බදු මත පදනම් වේ. |
| **බිල්පත් මිලදී ගැනීම** | | | 3. ලබා දිය හැකි මුදල් ප්‍රමාණය, පොලී අනුපාත සහ නියම සහ කොන්දේසි පිළිබඳ විස්තර දක්වන ලිපියක් අදාල ගනුදෙනුකරුගේ දැනගැනුම සඳහා යොමු කළ යුතුය. | 4. **නැවත ගෙවීමට කාලය:** ක්‍රියාකාරී ප්‍රාග්ධන චක්‍රයට අනුව. |
| **ඇපකර සේවා** | අපනයන ලේඛනවලට අදාල මූල්‍ය සේවා ඉහළ නැංවීම. උදාහරණයක් වශයෙන් - ගැනුම්කරුවන්ගෙන් මුදල් ලැබෙන තුරු.<br><br>රේගු සහ ටෙන්ඩර් ක්‍රියාමාර්ග සඳහා ඇපකර නිකුත් කිරීම (උදාහරණයක් වශයෙන් - ඉල්ලුම් බන්ධන, අත්තිකාරම් ගෙවීම් ඇපකර සහ ක්‍රියාකාරී ඇපකර). | කොන්ත්‍රාත් සහ අපනයන තීරු බදු කළමනාකරණය සුරක්ෂිත කිරීම. | 4. අයදුම්කරන ලද බැංකු සේවා පහසුකම පිරිසැකසුම් කිරීම සඳහා තොරතුරු දක්වන ලද ලිපිය සහ වෙනත් අවශ්‍ය තොරතුරු භාරගන්නා තෙක්, සබඳතා කළමනාකරු (RM) විසින් යෝජිත පහසුකම් සඳහා විස්තර සහිත ණය යෝජනාව සකස් කිරීම. | 5. **නැවත ගෙවීම:** නැවත ගෙවීමේ ගිවිසුම්ගත කාලයට අනුව. |
| **විදේශ මුදල් හුවමාරුව** | විදේශ විනිමය ඉදිරි කොන්ත්‍රාත්තු, හුවමාරු සහ වෙනත් විදේශ විනිමය නිපැයුම්. | විදේශ මුදල් සහ පොලී අනුපාතයන් උච්ඡාවචනය වීමේ අවදානමෙන් ආරක්ෂාවීම. | | 6. **සුරක්ෂිතබව:** ව්‍යාපාරයේ ස්වභාවය, අවදානම් පැතිකඩ සහ වෙනත් බැංකු වෙත පිරිනමන සුරක්ෂිතබව මත පදනම් වේ. සාමාන්‍යයෙන් ස්ථාවර තැන්පතු සහ මුදල් එක් රැස් කිරීම, අධිපූර්ණයන් උගස් කිරීම සහ ලේඛන ගත ණය, අධික චංචල දේපොල සහ නිශ්චල දේපොල උගස් කිරීම, පුද්ගලික සහ ආයතනික ඇපකර ආදිය. |
| **ලීසිං සේවා** | වාහන මිලදී ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම. | වාහන ලීසිං කිරීම/ බදු අයකරගැනීමට හැකියාව ලබාදීම. | 5. ණය ආකෘතිය සහ බැංකුව වෙත අවශ්‍ය කෙරෙන තොරතුරු / ලියවිලි ප්‍රමාණයෙහි සංකීර්ණතාවය මත ණය යෝජනාව සූදානම් කිරීම සඳහා ගතවන කාලය තීරණය වේ. | |
| **පසු දින සඳහන් චෙක්පත් වට්ටම්කරණය** | ගනුදෙනුකරුගේ පසුවට දින සඳහන්කරන ලද චෙක් පත් සඳහා මුදල් කිරීමේ පහසුව . | ගනුදෙනුකරුවන්ගේ මුදල් ප්‍රවාහ ධණාත්මකව සිදුකිරීමට සහයෝගය ලබා දීම. | | |

| | | | | |
|---|---|---|---|---|
| | | | 6. සම්පූර්ණ කිරීමෙන් පසු ණය යෝජනාව විධායක ණය කමිටුවේ අනුමැතියට යොමු කෙරේ.<br><br>7. අනුමත වුවහොත් අදාල ණය පහසුකමෙහි ආකෘතිය, පොලී අනුපාත, සුරක්ෂිතබව සහ වෙනත් නියම සහ කොන්දේසි පිළිබඳ විධිමත් ලිපියක් ගනුදෙනුකරුට යොමු කළ යුතුය.<br><br>8. යෝජිත ණය යෝජනාව ප්‍රතික්ෂේප වුවහොත් කණ්ඩායම් නායක හෝ සබඳතා කළමනාකරු විසින් ඒ බව ගනුදෙනුකරුට දැනුම් දිය යුතුය.<br><br>9. බැංකුව විසින් අනුමත දීමනා ලිපිය ලැබීම සහ දීමනා ලිපියෙහි සියළු සුරක්ෂිත ලියවිලි තොරතුරු සම්පූර්ණ කිරීම මත අදාල පහසුකම ලබාදීම සිදු කළ යුතුය. | |